


# බියගම සහ වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නිරත දමිල සේවකයින් මුහුණ දෙන්නාවූ ගැටළු පිළිබඳ සාරාංශගත වාර්තාව

| | | |
|---|---|---|
| **පර්යේෂණ මෙහෙයවීම** | : | ශ්‍රමාභිමානී කේන්ද්‍රය |
| **පර්යේෂණය සිදු කරන ලද කාලය** | : | 2021 මැයි 10 - 2021 වමකහ 20 (කෝවිඩ් වසංගතය නිසා රට අගුලු දැමීමේ පියවර හේතුවෙන් පර්යේෂණය 2021.10.02 දින දක්වා දීර්ඝ කරන ලදී) |
| **පර්යේෂක** | : | මහේෂ්වරී ශංකර් |

**i.**කෙටි යෙදුම්

| | |
|---|---|
| BOI | ආයෝජන මණ්ඩලය |
| FTZ | නිදහස් වෙළෙඳ කලාපය |
| OT | අතිකාල |
| EPF | සේවක අර්ථසාධක අරමුදල |
| ETF | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල |

**ii.** තුති පිදුම

බියගම සහ වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු දෙමළ සේවකයන් මුහුණ දෙන්නා වූ ගැටලු පිළිබඳව සැකසී ඇති මෙම සාරාංශගත පර්යේෂණ වාර්තාව සැකසීම සඳහා සහාය ලබාදුන් ශ්‍රමාභිමානී කේන්ද්‍රයේ සැලසුම්කරණ සම්බන්ධීකාරක සුගත් රාජපක්ෂ මහතාටත් ව්‍යාපෘති සහකාර රොෂානි මෙනවියටත් පර්යේෂණයට සහභාගිවෙමින් තමන්ගේ අදහස් ඉදිරිපත් කළ නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු සේවකයින්, මීට ඉහතදී සේවය කළ සේවකයින්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන්, නිදහස් වෙළඳ කලාපයේ නීති නිලධාරී සහ සිවිල් සංවිධාන නායකයින් යනාදී සියලු පාර්ශවයන්ටත් මීට පෙර මෙවැනි සාරාංශගත පර්යේෂණ වාර්තාවක් සැකසීමෙන් ලබාගත් අත්දැකීම් අප සමග බෙදාගත් නීතිඥ සුවස්තිකා අරුල්ලිංගම් මහත්මියටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි.

**පටුන**


01. හැඳින්වීම 05

02. සන්දර්භය 07

03. ක්‍රමවේදය 08

04. පරීක්ෂණ සීමාවන් සහ ගැටලු 10

05. පර්යේෂණයෙන් සොයාගත් කරුණු 11

1. සේවකයින්ගේ පෞද්ගලික විස්තර 11
2. අධ්‍යාපන මට්ටම 15
3. නිදහස් වෙළඳ කලාපයේ රැකියා අවස්ථා 17
4. නවාතැන් පහසුකම් 21
5. වියදම් 23
6. සිංහල භාෂා දැනුම 23
7. රැකියාව හා සබැඳි කරුණු 25
8. මිනිස් බල (manpower) සේවාව හා සම්බන්ධ කරුණු 25

06. නිර්දේශ සහ නිගමන 25

07. ආශ්‍රිත ග්‍රන්ථ 27

08. ඇමුණුම් 27

**iii.** විධායක සාරාංශය

ශ්‍රමාභිමානි කේන්ද්‍රය පිට පළාත්වලින් පැමිණ නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු පිළිසරණක් නොමැති සේවකයින් සමග සම්බන්ධ වී ඔවුන්ගේ රැකියා තත්වය උසස් කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ රැකියාව හා සම්බන්ධ අයිතිවාසිකම් සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරයි.

විශේෂයෙන් පිට පළාත්වලින් රැකියා සඳහා සංක්‍රමණය වී කොළඹට පැමිණ නිදහස් වෙළඳ කලාපයේ රැකියා අපේක්ෂාවෙන් පැමිණ සිටින දෙමළ සේවකයින් වර්තමාන සන්දර්භය තුළ මුහුණ දෙන්නාවූ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණයක් සිදු කොට වාර්තාවක් සැකසීමේ අරමුණෙන් මෙම වාර්තාව සම්පාදනය කර තිබේ.

මෙම වාර්තාව සැකසීමේදී අරමුණු කොටගත් ඒවා අතුරින් පිට පළාත්වලින් පැමිණි දෙමළ සේවකයින් නිදහස් වෙළඳ කලාපයේ මුහුණ දෙන්නා වූ ගැටළු විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග, අයිතිවාසිකම් හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම, රැකියා අයිතිවාසිකම් සුරැකීම සඳහා තිබෙන අණපනත්, භාෂා අයිතිය සුරැකීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ විසින් සිදු කළ යුතු කටයුතු යනාදිය හඳුනාගනිමින් අවධාරණය කර තිබේ.

මෙම සන්දර්භ වාර්තාව විශේෂයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණ (Quantitative and Qualitative) ක්‍රමවේද යොදා ගනිමින් සිදු කර තිබේ.

2021 මැයි මස සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාල වකවානුව තුළදී තොරතුරු රැස් කරන ලදී. විශේෂයෙන් මාර්ගගත සාකච්ඡා ඔස්සේ මෙන්ම සේවකයින්ට ලබා දුන් ප්‍රශ්න මාලාවක් ඔස්සේ ලබාගත් තොරතුරු මෙන්ම මීට පෙර පර්යේෂකයින් හා විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමැති විද්වතුන් විසින් සම්පාදනය කරනු ලැබූ වාර්තා සහ පොතපත ඔස්සේ උකහා ගනු ලැබූ තොරතුරු සහ සිවිල් සමාජ සංවිධාන, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ නිදහස් වෙළඳ කලාපය හා සම්බන්ධ වෙනත් පාර්ශවයන් සමග සාකච්ඡා කිරීමෙන් ලබාගත් තොරතුරු පදනම් කරගනිමින් මෙම වාර්තාව සැකැසී තිබේ.

තොරතුරු රැස් කිරීම තුළින් හඳුනාගනු ලැබූ ගැටලු නිරාකරණය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා මෙම වාර්තාවේ අන්තර්ගත වී තිබේ.

සවිස්තරාත්මක තොරතුරු සමුදායකින් සමන්විත මෙම සන්දර්භ වාර්තාව තුළ හැඳින්වීම, මේ විෂය හා සම්බන්ධව දැනට සිදු කර තිබෙන පර්යේෂණ, එම පර්යේෂණ ඔස්සේ හඳුනාගනු ලැබූ ගැටලු සහ ඒවා නිරාකරණය කිරීම සඳහා යුතු ක්‍රියාමාර්ග මෙන්ම මෙම පර්යේෂණය හා සම්බන්ධ වගු සහ පාරිභාෂිත වචන හා රූප සටහන් මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ.

බියගම සහ වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු දෙමළ සේවකයින් මුහුණ දෙන්නා වූ ගැටලු හඳුනාගනිමින් එම ගැටළු විසඳීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් කම්කරුවන්ගේ යහපත සඳහා වූ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කිරීම වෙනුවෙන් සේවකයන්ගේ අයිතිවාසිකමක් වන වෘත්තීය සමිති පිහිටුවා ගැනීම සහ ඒ තුළින් සාමූහිකව කේවල් කිරීම යනාදී කාරණා පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සහ පුහුණුව ලබා දීම පිළිබඳව අවධානය යොමු කර තිබේ.

## 01. හැඳින්වීම

**පසුබිම:**

ශ්‍රී ලංකා රජය විසින් රටේ ආර්ථිකය ගොඩනැගීම සඳහා 1978 සිට අපනයනය අරමුණු කරගත් කර්මාන්තවලට ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී. මේ සඳහා ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණෙන් අපනයන සැකසුම් කලාප බිහි කළේය.

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දෙනු ලැබූ නිදහස් වෙළඳ කලාප ව්‍යාපෘතිය යටතේ පළමුව 1978 අගෝස්තු මාසයේදී පලමු වන නිදහස් වෙළෙඳ කලාපය කටුනායක ප්‍රදේශයේ ස්ථාපිත කරන

ලදී. ඉන් අනතුරුව 1982 දී කොග්ගල නිදහස් වෙළඳ කලාපය ද 1992 සිට තවත් වෙළෙඳ කලාප රාශියක් ද ස්ථාපිත කරන ලදී. එහෙත් එදා සිට අද දක්වා නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු සේවකයින් ගැටළු ගණනාවකට මුහුණදෙමින් සිටිති.

නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන කම්කරුවන් මුහුණ දෙන විවිධ ගැටළු පිළිබඳව වීරසූරිය මහතා විසින් සිදුකරන ලද මූලික පර්යේෂණයෙන් පෙන්වා දෙන ලදී. ඔහුගේ එම පර්යේෂණයෙන් නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු දෙමළ සේවකයින්ගෙන් බහුතරයක් උතුරු නැගෙනහිර ප්‍රදේශයෙන් නොව සෙසු දිස්ත්‍රික්ක වලින් පැමිණ තිබෙන බව අවධාරණය කරන ලදී. එහෙත් 2010 න් පසුව රට සාමාන්‍ය තත්ත්වයට පත්වීමෙන් පසුව උතුරු නැගෙනහිර ප්‍රදේශයෙන්ද සේවකයින් රැකියා අපේක්ෂාවෙන් නිදහස් වෙළඳ කලාප වලට පැමිණ තිබෙන බව පෙන්වා දෙයි.

ඉන් අනතුරුව 2019 අවසාන කාල පරිච්ඡේදයේ දී සහ 2020 ජනවාරි මාසයේදී සුවස්තිකා අරුල්ලිංගම් විසින් " කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවයෙහි නියුතු දෙමළ කම්කරුවන් විසින් මුහුණ දෙන්නා වූ ගැටළු පිළිබඳ සාරාංශගත වාර්තාව" යන මැයෙන් පර්යේෂණයක් වාර්තාවක් සකසන ලදී. මෙම වාර්තාවේ නිදහස් වෙළඳ කළාපයේ සේවය කරන දෙමළ කම්කරුවන් මුහුණ දෙන්නාවූ සුවිශේෂී ගැටළු පිළිබඳව පර්යේෂකයා විසින් කරුණු ගෙන හැර දක්වා තිබේ.

**පර්යේෂණ අරමුණු සහ විෂය පථය**

බියගම සහ වතුපිටි වල වැනි ප්‍රදේශවල නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන දෙමළ කම්කරුවන් මුහුණ දෙන්නා වූ ගැටලු හඳුනාගෙන ඒ සඳහා දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීය සමිති පිහිටුවා සාමූහිකව කේවල් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සහ පුහුණුව ලබා දීම,

## 02. සන්දර්භය

නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දෙනු ලැබූ නිදහස් වෙළඳ කලාප පළමුව 1978 දී කටුනායක ප්‍රදේශයේ ද ඉන් අනතුරුව 1982 දී කොග්ගල ප්‍රදේශයේ ද ඉන්පසුව 1992 දී බියගම ප්‍රදේශයේ ද ස්ථාපිත කරන ලද අතර ඉන් අනතුරුව රටේ විවිධ ස්ථානවල නිදහස් වෙළඳ කලාප ගණනාවක් ස්ථාපිත කරන ලදී.

නිදහස් වෙළඳ කලාපයේ ආයෝජන සිදු කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ අවසරය ලබාගත යුතු අතර ආයෝජනය කළ යුතු අවම මුදල් ප්‍රමාණයක් ද තිබේ. එමෙන්ම මෙම වෙළඳ කලාප තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවලින් 90% අපනයනය කළ යුතුය.

මෙම ආයෝජනය සිදු කිරීම වෙනුවෙන් පළමු අවුරුදු පහේ සිට 15 දක්වා වූ කාල පරිච්ඡේදයකට බදු විරාමයක් ලබා දෙන අතර තවත් අවුරුදු පහළොවකට 2% සිට 5% දක්වා බදු සහනයක් ලැබෙයි. එපමණක් නොව විදේශිකයන්ට ගෙවනු ලබන වැටුප සඳහාද බදු පැනවීමක් සිදු නොකරන අතර ඔවුන් උපයන ආදායම තමන්ගේ රටට ප්‍රේෂණය කිරීම සඳහා අනුමැතියද හිමිවේ. එපමණක් නොව වෙනත් සුවිශේෂී බදු සහන රාශියක් නිදහස් වෙළඳ කලාප ක්‍රමවේදය තුළ හඳුන්වා දී තිබේ.

**නිදහස් වෙළඳ කලාප බිහි කිරීමේ අරමුණු:**

- විදේශ විනිමය උපයා ගැනීම සඳහා අපනයනය වැඩි කළ හැකි නිෂ්පාදන වල නිරතවී නව වෙළෙඳ පොළ අවස්ථා ලඟාකර ගැනීම.
- රැකියා නොමැති අධ්‍යාපන සුදුසුකම් තිබෙන තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දී ආදායම් උපයා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- රට තුළ තිබෙන මානව සම්පත් වලට කුසලතා මුසු කිරීම තුළින් එකී මානව සම්පත් උපයෝගී කරගනිමින් නිෂ්පාදනය ඉහළ දැමීම.

- දේශීය සේවකයින්ට නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව විදේශීය විශේෂඥයන් මගින් ලබා ගැනීම.

නිදහස් වෙළඳ කලාපයේ ක්‍රියාත්මක වන ආයතන සහ රැකියා නියෝජිතයින් ආයෝජන මණ්ඩලයෙන් පාලනය වන අතර දේශීය රැකියා නීති රීති වලට ගරු කරමින් පඩි පාලක සභා ආඥා පනත, කර්මාන්තශාලා ආඥා පනත යනාදී පනත් වල සඳහන් රැකියා කොන්දේසි පිළිපැදිය යුතු අතර රැකියා හා සබැඳි පහත දැක්වෙන නීතිරීති වලට ද අනුගත විය යුතුය.

1 සාප්පු සහ කාර්යාල සේවක පනත

2 පඩිපාලක සභා ආඥා පනත

3 වෘත්තීය සමිති ආඥා පනත

4 මාතෘ ප්‍රතිලාභ පනත

5 කර්මාන්තශාලා ආඥා පනත

6 කම්කරු වන්දි ආඥා පනත

7 සේවක අර්ථසාධක අරමුදල් පනත

8 සේවකයන්ගේ රැකියාව අවසාන කිරීමේ ( විශේෂ විධිවිධාන) පනත

9 කාර්මික ආරවුල් පනත

10 පාරිතෝෂික ගෙවීම් පනත


## 03.ක්‍රමවේදය

තොරතුරු රැස් කිරීම පර්යේෂකයාගේ මෙහෙයවීම යටතේ ශ්‍රමාභිමානී කේන්ද්‍රයේ ව්‍යාපෘති සහායිකාවගේ සෘජු අධීක්ෂණය යටතේ ලබා දෙනු ලැබූ ප්‍රශ්ණාවලියක් මගින් සිදු කරන ලදී. මෙහිදී බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන සේවකයින් පනස් දෙනෙක් වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන සේවකයින් පනස් දෙනෙක් විසින් ප්‍රශ්න අරලිය සම්පූර්ණ කරන ලදී. මෙම සන්දර්භ වාර්තාව විශේෂයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු පදනම් කර ගනිමින් සිදු කරන ලදී.


විශේෂයෙන් දෙමළ සේවකයින් මුහුණ දෙන්නා වූ ප්‍රශ්න පිළිබඳව සම්පාදනය කරනු ලබන වාර්තාවක් බැවින් ප්‍රශ්ණාවලිය ට පිළිතුරු සපයන පිරිස කඳුකරය සහ උතුරු නැගෙනහිර ප්‍රදේශය නියෝජනය කරන සිය දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමක් විය. එමෙන්ම මාර්ගගත ZOOM තාක්ෂණය භාවිතා කරමින් කම්කරු නීති සහ කම්කරුවන් මුහුණ දෙන්නාවූ ප්‍රශ්න පිළිබඳ වැඩමුළුව 2021.08.08 වන දින පවත්වන ලදී. මෙහිදී වර්තමාන සන්දර්භය තුළ කම්කරුවන් මුහුණ දෙන්නා වූ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන ලදී.

එමෙන්ම සේවකයින්ගේ යහපත සඳහා ක්‍රියාත්මක වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් යනාදී පාර්ශ්වවලින් අමතර තොරතුරු සපයා ගන්නා ලදී.

රූප සටහන 1 - තොරතුරු රැස් කිරීමේ විස්තර




1.1 වතුපිටි වල



1.1 බියගම

## 04. පර්යේෂණ සීමා සහ ගැටලු

අපේ රටේ පමණක් නොව මුළු ලෝකය පුරාම ව්‍යාප්ත වූ කෝවිඩ් 19 වසංගතය නිසා රටේ ක්‍රියාත්මක වූ අගුලු දැමීම හේතුවෙන් මෙම පර්යේෂණයට යම් යම් පසුබෑම් වලට මුහුණ දීමට සිදු විය. සැලසුම් කළ අයුරින් ඉලක්ක කණ්ඩායම් සමඟ මුහුණට මුහුණ ලා සාකච්ඡා කිරීමට නොහැකි වූ අතර ප්‍රශ්ණාවලිය සාමාජිකයන් අතට පත් කිරීම සහ ඒවා නැවත ලබා ගැනීමේදී ද යම් යම් ගැටලුකාරී තත්වයන් පැවතුණි. ගුගුල් ආකෘති පත්‍රය ඔස්සේ ප්‍රශ්ණාවලිය ලැබෙන්නට සලස්වා එය සම්පූර්ණ කර ගැනීමට ගත් උත්සාහය එතරම් සාර්ථක නොවූ නිසාද සේවකයින් එම ප්‍රශ්ණාවලිය පිරවීම සඳහා අසමත් වූ නිසාද අපට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ තොරතුරු රැස් කිරීමට දැඩි අපහසුතා ඇතිවිය.

පර්යේෂණය සඳහා තෝරාගනු ලැබූ බියගම සහ වතුපිටිවල යනාදී ප්‍රදේශ වල පිහිටා තිබෙන නිදහස් වෙළඳ කලාපවල සේවය කරන දෙමළ සේවකයින් පමණක් පර්යේෂණයට උපයෝගී කර ගන්නා ලදී. එබැවින් රැස්කළ තොරතුරු බියගම සහ වතුපිටිවල නිදහස් වෙළඳ කලාපවල සේවය කරන දෙමළ කම්කරුවන් මුහුණ දෙන්නාවූ සියලු ප්‍රශ්න පිළිබඳව කරුණු හෙළිදරව් කරන පරිපූර්ණ තොරතුරු සමුදායක් නොවුනත් ලබාගත් තොරතුරු මත පදනම්ව ඔවුන් භාෂාව හා සම්බන්ධව ද රැකියා ස්ථානයේ ද නවාතැන් සලසා ගත් ස්ථාන වල ද රාජ්‍ය සේවකයින්ගෙන් විවිධ සේවා ලබාගැනීමට උත්සාහ දැරීමේදී ද ඔවුන් මුහුණ දෙන බොහෝ ගැටලු පිළිබිඹු කරයි.


## 05. පර්යේෂණය තුළින් සොයාගත් කරුණු


## තොරතුරු විශ්ලේෂණය

බියගම සහ වතුපිටිවල නිදහස් වෙළඳ කලාප වල සේවය කරන සේවකයින්ගෙන් එක් එක් වෙළඳ කලාපයේ සේවකයින් පනස් දෙනෙකුගෙන් මෙම තොරතුරු රැස් කර ගන්නා ලදී.


### 1. සේවකයින් ගේ පෞද්ගලික තොරතුරු

මෙම තොරතුරුවලින් එකී නිදහස් වෙළඳ කලාපවල සේවය කරන අයවලුන් අයත් වන දිස්ත්‍රික්ක සහ ඔවුන්ගේ වයස් කාණ්ඩ 2.3 වගුව පෙන්නුම් කරයි.



40 වඩා වැඩි - 0.0%
18 - 20: 4 - 8.0%
31 - 40: 8 - 16.0%
26 - 30: 4 - 8.0%
21 - 25: 34 - 68.0%
18 - 20
21 - 25
26 - 30
31 - 40
40 க்கு மேல்
meta-chart.com


Blank: 0 - 0.0%
18-20: 2 - 4.0%
31-40: 1 - 2.0%
26-30: 11 - 22.0%
21-25: 36 - 72.0%
18-20
21-25
26-30
31-40
Blank
meta-chart.com


වයස් කාණ්ඩ අනුව නිදහස් වෙළඳ කලාපවල වයස අවුරුදු 21 සිට 25 දක්වා වූ සංඛ්‍යාව ඉතා අධිකය. වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේ 34 දෙනෙකු සහ බියගම 36 දෙනෙකු සේවය කරන අතර වයස අවුරුදු 40 ට වඩා වැඩි කිසිවෙකුත් වතුපිටිවල වෙළඳ කලාපයේ නොමැති අතර බියගම වෙළඳ කලාපයේ සිටින්නේ එක් සේවකයෙකු පමණි.





3.1 වතුපිටිවල




3.1 බියගම









මෙම නිදහස් වෙළඳ කලාප දෙකෙහිම පිරිමි පාර්ශවයට වඩා කාන්තා පාර්ශවයේ සංඛ්‍යාව අධිකය. පුද්ගලික තොරතුරු ලබාගැනීම සඳහා වූ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී "විවාහක" හෝ "අවිවාහක" යන පිළිතුර පමණක් ලබාදුන් අතර "වෙන්වී ජීවත්වීම" 'දික්කසාද වී සිටීම" යනාදී තත්වයන් පිළිබඳ කරුණු දැනගැනීම සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර තිබුණද කිසිවකු දික්කසාද වූ බව හෝ ජීවත් වන බව පිළිඹිමු වන ආකාරයේ පිළිතුරු ලබා දී නොතිබුණි.

විවාහ වූ අයට දරුවන් සිටින්නේ ද නැතහොත් නොසිටින්නේ ද යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම


පිළිතුරු සැපයීමේ දී දරුවන් ඔවුන් සමග නැතහොත් දෙමව්පියන් සමග එසේත් නැතහොත් ඥාතීන් සමග වාසය කරන බව සඳහන් කර තිබුණි. ඔවුන්ගේ දරුවන් පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙන් විස්තර කෙරේ.








## 2. අධ්‍යාපන තත්වය

ඉන්පසුව සේවකයන්ගෙන් අසනු ලැබූ ප්‍රශ්නය වූයේ ඔවුන් ලබාගත් විධිමත් හෝ නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයයි. 99% ක් තමන් පාසල් අධ්‍යාපනය ලබාගත් බව සඳහන් කර තිබුණි. එයින් සැලකිය යුතු සේවකයින් සංඛ්‍යාවක් තමන් අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබෙන බව පවසා තිබුණි. ඔවුන් ලබා දුන් පිළිතුරු මෙසේය.




4.1 Wathupitigama





4.1 බියගම


පවුලේ ආර්ථික තත්ත්වය, දිළිඳුකම සහ යුද්ධය හේතුවෙන් තමන්ගේ අධ්‍යාපන කටයුතු අතරමග ඇන හිටි බව සඳහන් කර තිබුණි.

**3. නිදහස් වෙළඳ කලාපයේ රැකියා අවස්ථා**

නිදහස් වෙළඳ කලාපයේ රැකියා අවස්ථා පිළිබඳ දැන ගත් ආකාරය ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබුණු අතර එයට පිළිතුරු සැපයීමේ දී තමන්ගේ මිතුරන්ගෙන් ඒ පිළිබඳව දැනගත් බව වතුපිටිවල නිදහස් වෙළෙඳ කලාපයේ 30 දෙනකුද බියගම නිදහස් වෙළඳ කලාපයේ 27 දෙනෙක් ද ප්‍රකාශ කර තිබුණි. සාමාන්‍යයෙන් පුවත්පත් මාර්ගයෙන් දැන්වීම් පළකිරීම තුළින් තිදෙනකු පමණක් රැකියාවට බැඳී ඇත. විශේෂයෙන් වතුපිටිවල වෙළෙඳ කලාපය මුහුණු පොතේ දැන්වීම් ඔස්සේ දැනගැනීමෙන් 11 දෙනෙකු රැකියාවට බැඳී ඇත.




4.1 වතුපිටිවල




4.1 බියගම


රැකියාවට බඳවා ගැනීමේදී කිසිම සම්මුඛ පරීක්ෂණයකට සහභාගී නොවී වතුපිටි වල වෙළඳ කලාපයේ 9 දෙනෙක්ද බියගම වෙළඳ කලාපයේ 16 දෙනෙක්ද රැකියාවට බැදී ඇත.

පෙර අත්දැකීම් පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ඉන්දියාවෙන් අත්දැකීම් ලබාගත් 14 දෙනෙකුද කිසිම අත්දැකීමක් නොමැතිව 36 දෙනෙකු ද රැකියාවට බැඳී ඇත. බියගම නිදහස් වෙළෙඳ කලාපය ගත්කල එක් පුද්ගලයකු හැර 49 දෙනෙකු කිසිම අත්දැකීමකින් තොරව රැකියාවට සම්බන්ධ වී ඇත.


තමන් නිරත රැකියාව තාවකාලික ද නැතහොත් ස්ථිර ද යන පැනයට පිළිතුරු සැපයීමේ දී වතුපිටිවල වෙළඳ කලාපයේ 35 දෙනෙකු ස්ථිර බවත් 9 දෙනෙකු තාවකාලික බවත් සඳහන් කර තිබුණි. 6 දෙනෙකු කිසිම දෙයක් සඳහන් කර නොතිබුණු අතර බියගම නිදහස් වෙළෙඳ කලාපයේ 2 දෙනෙකු ස්ථිර බව ද 22 දෙනෙකු තාවකාලික බව ද දෙදෙනෙක් කිසිම දෙයක් සඳහන් නොකර ද තිබුණි.

රැකියාවේ ස්වාභාවය පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී වතුපිටි වල 40 දෙනකු මැෂින් ඔපරේටර්වරු බවත් බියගම නිදහස් වෙළෙඳ කලාපයේ 19 දෙනෙකු මැෂින් ඔපරේටර්වරු බවත් සඳහන් කර තිබුණු අතර මිනිස් බල සැපයීමේ ආයතනයේ සේවකයින් ලෙස වතුපිටිවල දෙදෙනෙකුත් බියගම 10 දෙනෙකුත් තමන්ගේ රැකියා ස්වභාවය සඳහන් කර තිබුණි.

.





5.1 වතුපිටිවල





5.1 බියගම

ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කිරීමේදී ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් උසුලන සන්නාම සහිත ආයතනවල සේවය කරන අතර ඔවුන් Nike" Puma" Willies" Dorothy" lululemon සන්නාම සහිත භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටිති. මෙම නිෂ්පාදන යුරෝපය, කැනඩාව, එක්සත් අමෙරිකාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍ය, ඉන්දුනීසියාව සහ චීනය වැනි රටවල් වලට අපනයනය කරනු ලැබේ.

කොපමණ කාලයක් සේවය කරන්නේ ද යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ඉහත නිදහස් වෙළඳ කලාප දෙකෙහි ම හත් දෙනෙක් බැගින් මාස 6කට වඩා අඩු කාලයක් සේවය කරන බව පවසා තිබුණි. අවුරුදු දෙකකටත් වඩා අඩු කාලයක් සේවය කරන සේවකයන්ගෙන් වතුපිටිවල නිදහස් වෙළෙඳ කලාපයේ 32 දෙනකුද බියගම නිදහස් වෙළෙඳ කලාපයේ 234 දෙනෙකුද සේවය කරති. අවුරුදු පහකටත් වඩා වැඩි කාලයක් සේවය කරන පිරිසෙන් වතුපිටිවල 3 දෙනෙකුද බියගම කලාපයේ 2 දෙනෙකුද සිටිති.


40
30
20
10
0
7
34
7
2
Series 1
meta-chart.com


6.1 වතුපිටිවල


40
30
20
10
0
7
32
5
3
3
Series 1
meta-chart.com


## 4. නවාතැන් පහසුකම්

නවාතැන් පහසුකම් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පිට පළාත්වලින් පැමිණි නිදහස් වෙළඳ කලාපයේ සේවකයින්ට නවාතැන් පහසුකම් සපයා ගැනීම අභියෝගයක් වී තිබේ. නිවාස වල කුලියට කාමරයක් ගෙන තමන්ගේ යහළුවන් සමග ජීවත් වෙති. මෙලෙස වතුපිටිවල 37 දෙනෙකුත් බියගම 22 දෙනෙකුත් කුලී කාමර වල ජීවත් වන බව සඳහන් කර තිබේ. විශේෂයෙන් දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි.

4.2 සේවකයින්ගේ නවාතැන් පහසුකම් පිළිබඳ විස්තර පහත දැක්වෙන රූපසටහනෙන් දැක්වෙයි.




7.1 වතුපිටි වල




7.1 බියගම

ගෙවල් කුලී සහ අනෙකුත් වියදම් පිළිබඳ විස්තර දෙස අවධානය යොමු කිරීමේ දී බහුතරයක් තමන්ගේ ආදායමෙන් අඩක් ගෙවල් කුලිය සඳහා වැය කරනු ලබති. තමන්ගේ වියදම අඩු කර ගැනීමේ අරමුණින් තමන්ට අවශ්‍ය ආහාර පාන තමන් විසින්ම සකස් කරගන්නා 44 දෙනෙකු වතුපිටිවල නිදහස් වෙළඳ කලාපයේත් 43 දෙනෙකු බියගම වෙළඳ කලාපයේත් හමුවේ. තමන්ට දිවා ආහාරය සේවා ස්ථානයෙන් ලබාදෙන බව වතුපිටිවල 35 දෙනෙකුද බියගම 47 දෙනෙකුද සඳහන් කළහ.

**5. වියදම්**

ගෙවල් කුලිය, විදුලි බිල, ආහාර වියදම් ඇතුළුව මාසික වියදම් පිළිබඳව විස්තර මෙම ප්‍රශ්නය තුලින් ලබා ගනු ලැබිණි. නිදහස් වෙළඳ කලාපය අවට පිහිටි නිවාස වල කුලිය රුපියල් 8000/- සිට රුපියල් 15,000/- දක්වා පරාසයක පවතී. කාමරයක් කුලියට ගත් විට ඒ සඳහා වන කුලිය රුපියල් 2500/- සිට රුපියල් 7500/- දක්වා වෙනස් වෙනස් වේ. තනි පුද්ගලයින් විසින් සඳහන් කර තිබෙන මුදල් ප්‍රමාණය මත පදනම්ව සලකා බැලීමේදී තනි පුද්ගලයකු සඳහා වන මාසික වියදම රුපියල් 7,500/- සිට රුපියල් 25,000/- දක්වා පවතී. එමෙන්ම තමාගේ පවුල සමඟ ජීවත්වන කම්කරුවකුගේ මාසික වියදම රුපියල් 7500/- සිට රුපියල් 35000/- දක්වා පරාසයක පවතී. පවුල සමඟ ජීවත්වන බොහෝ කම්කරුවන් රුපියල් 30000/- සිට 35000/- මුදලක් මාසිකව වැය කරයි.

බොහෝ සේවකයින්ට ප්‍රමාණවත් නාන කාමර පහසුකම් නොමැත. සමහර ස්ථානවල පුද්ගලයින් 10 සිට 20 දක්වා සංඛ්‍යාවක් එක් නානකාමරයක් භාවිතා කළ යුතු වේ.

**6. සිංහල භාෂා දැනුම**

සිංහල භාෂා දැනුම පිළිබඳ අවධානය යොමු කිරීමේදී බොහෝ දෙනෙකු කොළඹට පැමිණෙන විට සිංහල භාෂාව පිළිබඳ කිසිම දැනුමකින් තොරව පැමිණ තිබේ.

ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කළ සියලු දෙනාම කිසියම් හෝ කාරණයක් ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය නිලධාරියෙකු හමුවී තිබේ. මෙම නිලධාරීන් අතුරින් ග්‍රාමසේවක මහතා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන්, කම්කරු නිලධාරීන් වැනි නිලධාරීන් හමුවී තිබේ. මෙම නිලධාරීන්ගෙන් දෙදෙනකුට පමනක් දෙමළ කතා කිරීමේ හැකියාව තිබුණු බව සඳහන් කර තිබේ.

බියගම

| | හැක | නොහැක |
|---|---|---|
| ලිවීම | 01 | 45 |
| කතා කිරීම | 17 | 31 |

| | | |
|---|---|---|
| කියවීම | 04 | 40 |

ප්‍රශ්න 6.2

| | හැක | නොහැක |
|---|---|---|
| ලිවීම | 01 | 39 |
| කතා කිරීම | 40 | 05 |
| කියවීම | 32 | 32 |

ප්‍රශ්න 6.2

## වතුපිටි වල

| | හැක | නොහැක |
|---|---|---|
| ලිවීම | 05 | 41 |
| කතා කිරීම | 30 | 18 |
| කියවීම | 04 | 26 |

ප්‍රශ්න 6.1

| | හැක | නොහැක |
|---|---|---|
| ලිවීම | 03 | 40 |
| කතා කිරීම | 36 | 11 |
| කියවීම | 04 | 25 |

ප්‍රශ්න 6.2

**7. රැකියාව පිළිබඳව**

රැකියා ගිවිසුම පිළිබඳ ප්‍රශ්නයට වතුපිටිවල වෙළඳ කලාපයේ 38 දෙනෙකු ඔව් යනුවෙන් ද එක්කෙනෙකු නැත යනුවෙන් ද දසදෙනෙකු කිසිම පිළිතුරක් ලබා නොදී ද තිබේ. බියගම වෙළඳ කලාපයේ 37 දෙනෙකු රැකියා ගිවිසුමක් තිබෙන බවත් 13 දෙනෙකු රැකියා ගිවිසුමක් නොමැති බවද සඳහන් කර තිබේ.

කම්කරු නීතියට අනුව රැකියාවේ නිරත වන කාලය දහවල් කාලයේ රැකියාව හා රාත්‍රී කාලයේ රැකියාව යන ද්විත්වයම අන්තර්ගතය. සාමාන්‍යයෙන් වැඩ කරන වේලාව යනු සඳුදා සිට සිකුරාදා දක්වා දින 5ක් පැය 9ක වැඩ කරන කාලයක් ඇතුලත් වන අතර එයින් පැයක් කෑම වේලාව සඳහා ද විවේක ගැනීම සඳහා ද යොදාගත හැක. එහෙත් නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන සේවකයින් ඔවුන්ගේ විවේක වේලාව තුළදීත් යන්ත්‍රයක් මෙන් ශ්‍රමය ලබා දිය යුතුය.

**8. මිනිස් බල සේවාව පිළිබඳව**

මිනිස් බල ආයතන සේවකයින් ගත්කල ස්ථිර සේවකයින්ට ලැබෙන වැටුපට වඩා යම් වැඩි වැටුපක් ඔවුන්ගේ දෛනික කුලිය ලෙස ලැබුණද ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාවය සහ අනෙක් සේවක වරප්‍රසාද කිසිසේත්

නොමැති තත්ත්වයක් දක්නට ලැබේ. කෝවිඩ් 19 වසංගතයේ බලපෑමට ලක්වී මුළු රටම වසා තබා තිබෙන තත්වයක් තුළ මොවුන්ගෙන් බොහෝ දෙනෙකුට රැකියා අවස්ථා නොලැබේ. වැටුප් සමග නිවාඩු යන සංකල්පය මොවුන්ට අදාළ නොවේ.

කර්මාන්තශාලාවල සේවකයින්ට ලබාදෙන ආහාර පිළිබඳ විමසීමේදී බොහෝ දෙනෙක් තමන්ට ලැබෙන ආහාර ප්‍රමිතියෙන් තොර බව සඳහන් කර තිබේ.

## 06. නිර්දේශ සහ නිගමන

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් සොයා ගනු ලැබූ කරුණු සහ සංඛ්‍යා දත්තවලින් ගම්‍යමාන වන කරුණු ඉස්මතුකර පෙන්වන අතර නිදහස් වෙළෙඳ කලාපය ආන්තිකකරණයට ලක් වී ඇති සේවිකාවන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම යනාදී සමස්ත සන්දර්භයට කෙසේ ගැලපෙන්නේද යන්න පෙන්වා දෙනු ලබයි. මෙම අධ්‍යයනය තුළින් සොයා ගත් එකී කරුණු මත පදනම්ව උපදේශක වරයා විසින් ඉදිරි ක්‍රියාමාර්ග සහ මෙම උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන සන්දර්භය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

සමස්ත සේවකයින් දෙස බැලීමේදී කාන්තාවන් පිරිමින් සමග සංසන්දනය කිරීමේදී පහළ මට්ටමේ සේවාවන් වල නිරත වී සිටින බව දක්නට ලැබෙන අතර පිරිමින් අධීක්ෂණය හා තාක්ෂණය වැනි ඉහළ මට්ටමේ කටයුතු භාර නිලධාරීන් ලෙස කටයුතු කරති. මෙයට ශ්‍රී ලංකාවේ සමාජ සන්දර්භය තුළ පවතින පුරුෂාධිපත්‍ය සමාජ ව්‍යුහය හේතුවක් විය හැකිය. එමෙන්ම සමාජීය හා සංස්කෘතික හේතු නිසාවෙන් කාන්තාවන් අවම නිපුණතාවකින් යුක්ත රාජකාරි කටයුතුවල නිරතවන අතර පිරිමින් තාක්ෂණික නිපුණතා සහිත රැකියාවල මෙන්ම අධීක්ෂණ හා කළමනාකරණ මට්ටමේ රැකියාවල නිරත වී සිටිති.

නෛතික රාමුව තුළ රාජකාරි වේලාව තුළ දහවල් සේවාමුර සහ රාත්‍රී සේවා මුර යන ද්විත්වයම ආවරණය වන අතර සාමාන්‍යයෙන් රාජකාරි දින යනු සතියේ සඳුදා දින සිට සිකුරාදා දිනයේ දක්වා දිනකට පැය නවයක් වන අතර එයින් පැයක කාලයක් ආහාර ගැනීම හා විවේකය සඳහා වෙන් කරනු ලැබේ. සෙනසුරාදා දිනවල දී පැය 6ක කාලයක් සේවය කළ හැකි වන අතර ඉන් පැය භාගයක කාලයක් ආහාර ගැනීම සඳහා වෙන් කෙරේ. එසේ වුවද නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන සේවකයින් තමන්ට ලබාදී ඇති නිෂ්පාදන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා මෙන් නිශ්චිත රාජකාරි වේලාවෙන් ඔබ්බට සේවය කළ යුතු තත්ත්වයක් උදාවී තිබේ.

මිනිස් බල සේවා සේවකයින්ගේ රැකියාව කිසිදු රැකියා සුරක්ෂිතභාවයකින් තොර වන අතර ඔවුන් ශ්‍රමය සූරා කෑමටත් ලක්වේ. එමෙන්ම පවුලේ වැදගත් කටයුතු වලට සහභාගි වීම සඳහා වුවද නිවාඩු ලබා ගැනීමට නොහැකි තත්ත්වයක සේවය කරති.

වෘත්තීය සමිති නොමැති තත්ත්වයක් තුළ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවලදී ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමටත් තමන්ට ලැබිය යුතු ප්‍රතිලාභ පිළිබඳව කේවල් කිරීමටත් නොහැකි තත්ත්වයක පසුවේ.

නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නියුතු දෙමළ කතාකරන කම්කරුවන්ට ආයතනයෙන් ලබා දෙනු ලබන රැකියා ගිවිසුම් සහ වැටුප් විස්තර මෙන්ම රැකියා පුහුණුව පිළිබඳ විස්තර ද සිංහල බසින් ලබාදෙන බැවින් ඔවුන්ට ඒවා කියවා තේරුම් ගැනීමට නොහැකි බව සඳහන් කරති.

රජයෙන් ලබා දෙනු ලබන සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී රාජ්‍ය නිලධාරීන් සිංහල බසින් පමණක් කතා කරන බැවින් එම සේවාවන් ලබා ගැනීමේ දී ද ගැටළු සහගත තත්වයක් උද්ගත වන බව මොවුන් ප්‍රකාශ කරති.

සේවකයින් උපයාගන්නා ආදායමෙන් අඩකටත් වඩා ප්‍රමාණයක් ආහාර සහ නවාතැන් පහසුකම් සඳහා වැය කිරීමට සිදුව තිබේ.

## 07 ආශ්‍රිත ග්‍රන්ථ

**08.ඇමුණුම්**

ඇමුණුම I: විෂය ක්ෂේත්‍රය

ඇමුණුම II: පර්යේෂණ ක්‍රියාකාරකම් ලැයිස්තුව

ඇමුණුම III: නිදහස් වෙළඳ කලාපයේ පසුබිම

ඇමුණුම IV : කණ්ඩායම් සාකච්ඡාවේ වාර්තාව

ඇමුණුම V: පාර්ශවකරුවන්ගේ ලැයිස්තුව

ඇමුණුම VI: සම්මුඛ පරීක්ෂණ මාර්ගෝපදේශ

ඇමුණුම VII: සම්මුඛ පරීක්ෂණ ලැයිස්තුව

ඇමුණුම VIII: තේරීම් නිර්ණායක